# වාම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

11 කාණ්ඩය 02 කලාපය

2025 පෙබරවාරි-මාර්තු

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00


# රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය ‘තමසෙක්’ ක්‍රමයට!

## ජනාධිපති උපදේශක දුමින්ද හුළංගමුව

රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය කිරීමට ‘තමසෙක්’ ක්‍රමය අනුගමනය කළ යුතු බව ජනාධිපතිවරයාගේ උපදේශකයකුවන දුමින්ද හුළංගමුව පවසයි. අයවැය සම්බන්ධව CMA ආයතනයේ පැවති සංවාදයකදී ඔහු මේ බව ප්‍රකාශ කර තිබුණි. ඔහු එහිදී මෙසේ පවසා තිබුණි.

"වාහන ගේන්න ඉඩ දෙන්න ඕනෑ. ඒවාට ගහන බද්දෙන් ආණ්ඩුවට ආදායම් එනවා. එතකොට ව්‍යාපාරවලට බදු වැඩි කරන්න අවශ්‍ය නෑ. බදු වැඩි නොකර ආණ්ඩුවට ආදායම් ගන්න පුලුවන්. රාජ්‍ය ව්‍යවසායන් (SOE) අලුත් කළමනාකරණ සමාගමක භාරයට ගන්න ඕනෑ. ඒ කළමනාකරණ සමාගමින් අවශ්‍ය නම් මේ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කරන්නත් පුළුවන්. ඒ හරහා ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරන්න පුළුවන්. මේක තමයි අපි අනුගමනය කළ යුතු සිංගප්පූරුවේ තමසෙක් ආකෘතිය. මේ ව්‍යාපාරවලට තියෙන රාජ්‍යයේ බලපෑමත් ඉවත් කරන්න ඕනේ. මේ යෝජනා 2024 අයවැයේදීත් ඉදිරිපත් කළත් ඒවා ක්‍රියාත්මක උනේ නැහැ.

2025 අයවැයෙන් මේ ආණ්ඩුව 2024 අයවැයේ බදු ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්ව ආර්ථික පුළුල් කිරීම් ඉලක්ක පසුකර යනවා. පසුගිය ආණ්ඩුව සම්මත කළ දැනට තියෙන ආර්ථික පරිවර්තන පනතට සංශෝධන ඉදිරිපත් කරලා රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා, ව්‍යාපෘතිවලට තියෙන නීතිය වෙනස් කරනවා.

☞ 02 පිටුවට

# එක් පවුලක් මාසයකට ගෙවිය යුතු බදු එකතුව රුපියල් 8200කින් ඉහළට!

**මෙවර අයවැය ඇස්තමේන්තුවට අනුව සෑම පවුලක්ම 2025 වසරේදී භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී මසකට රුපියල් 40,000ක පමණ බද්දක් රජයට ගෙවිය යුතුව තිබේ. ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමු අයවැයට අනුව 2025 වසරේ අපේක්ෂිත භාණ්ඩ හා සේවා බද්ද රුපියල් බිලියන 2772කි. එය 2024 වසරේ භාණ්ඩ හා සේවා හරහා අය කරගත් බදු මුදල වන රුපියල් බිලියන 2301ට සාපේක්ෂව 20%ක ඉහළ යාමකි.**

පසුගිය වසරේ එක පවුලක් මාසිකව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ගෙවන ලද බද්දේ සාමාන්‍ය අගය රුපියල් 31,623ක් වූ අතර 2025 වසරේදී එම අගය රුපියල් 39,817 දක්වා ඉහළ යාමට නියමිතය. ඒ අනුව ජනතාවට පසුගිය වසරට වඩා මේ වසරේදී වැඩිපුර රුපියල් 8200ක මාසික වියදමක් බදු සඳහා වැයවනු ඇත.

භාණ්ඩ හා සේවා මත බද්ද 20%කින් ඉහල නැංවුවද වත්මන් ආණ්ඩුව ආදායම් බද්ද ඉහළ නංවා ඇත්තේ 2024දී රුපියල් බිලියන 1028 සිට මෙවර රුපියල් බිලියන 1167 දක්වා 11%ක සොච්චමකිනි. ඉහලම ධනපති සමාගම් විසින් නොගෙවා පැහැර හැර ඇති රුපියල් බිලියන 1068ක බදු නැවත අය කර ගැනීමට හෝ පසුගිය වසරේ ඉහළම සමාගම් වලට වලට ලබාදුන් රුපියල් බිලියන 978ක බදු සහන අඩු කිරීමට හෝ ආණ්ඩුවට අපේක්ෂාවක් නැති බව මෙම ඇස්තමේන්තු වලින් පෙනේ.

ඒ අනුව, මෙම ආණ්ඩුවද පෙර පැවති ආණ්ඩු මෙන්ම වැඩකරන ජනතාව මත බදු බර පටවා ධනපතියන් බද්දෙන් නිදහස් කරන ප්‍රතිපත්තියක සිටින බව අයවැය ඇස්තමේන්තුව ප්‍රදර්ශනය කර තිබේ.

# පෞද්ගලික සමාගම්වලට වාර්තාගත ලාභයක්

2024 වර්ෂ අවසානයේ සිය අවසන් ගිණුම් වාර්තා ප්‍රසිද්ධ කරනු ලැබූ සමාගම් ඉතිහාසයේ වාර්තාගත ලාභ වැඩිවීමක් ප්‍රකාශ කරයි.

සම්පත් බැංකුවේ බදු ගෙවූ පසු ලාභය රුපියල් බිලියන 27.3කි. පසුගිය වසරේ ඔවුන්ගේ සම්පූර්ණ පොලි ආදායම රුපියල් බිලියන 183 ඉක්මවා යයි. ජාතික සංවර්ධන බැංකුවේ බදු පසු ලාභය රුපියල් බිලියන 9කි ‘ඩයලොග් ආසියාටා’ පසු බදු ලාභය රුපියල් බිලියන 12.4ක් ලෙස සටහන් වේ. HNB පසු බදු ලාභය බිලියන 44.8ක් වේ. එය 2023 වසරට වඩා රුපියල් බිලියන 21ක වර්ධනයකි. ඒ සමග ඔවුන්ගේ වත්කම රුපියල් ට්‍රිලියන 2 දක්වා පුලුල් වෙයි.

HNB විසින් මිලදී ගත් භාණ්ඩාගාර බැඳුම්කරවලින් 30% ලංකා රුපියල් වන අතර 70%ක් ඇමරිකන් ඩොලර් වේ.

2022 ලංකාවේ ආර්ථිකය බිඳ වැටීමත් සමග භාණ්ඩාගාර බැඳුම්කර අහිමි වීමෙන් විය හැකි පාඩුව රුපියල්

☞ 02 පිටුවට

# කොළඹ වරාය නැගෙනහිර ජැටිය සංවර්ධනයට අදානි සමාගමෙන් බාධා!

කොළඹ වරායේ නැගෙනහිර ජැටිය හරහා බහාලුම් මෙහෙයුම් වර්ධනය කිරීමේ විශාල අවස්ථාවක් විවෘතව ඇත. ජාත්‍යන්තර නාවික භාණ්ඩ ප්‍රවාහන සමාගම් මේ සඳහා අයෝජනය කිරීමට ලංකා ආණ්ඩුව සමඟ එකඟතාව ප්‍රකාශ කර තිබේ. එහෙත් වරාය සංවර්ධනය සඳහා යැයි පවසමින් විදෙස් සමාගම් සමග පැමිණි ගිවිසුම් ඊට බාධාවක් වන බව වරාය අධිකාරිය පවසයි.

කොළඹ වරායේ බටහිර ජැටිය අදානි සමාගම වෙත පවරා දීමේදී අත්සන් කළ ගිවිසුම් වල බලපෑම නිසා නැගෙනහිර ජැටිය සංවර්ධනය කිරීමේ අවස්ථාව ඇත්තේ මෙරට රජයට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියට පමණකි.අදානි සමාගම සමග අත්සන් කළ ගිවිසුම විසින් වෙනත් තෙවන පාර්ශවයකට කොළඹ වරාය සංවර්ධනයට ප්‍රවේශ වීම වසර හතකට වලක්වනු ලබයි. අදානි සමාගම විසින් කළමනාකරණය කරනු ලබන කොළඹ බටහිර ජැටිය අනුයාත මාස හයකදී මසකට බහාලුම් මිලියන බාගයක් මෙහෙයවන අවස්ථාව දක්වා මේ නීතිය ක්‍රියාත්මක වේ.

ඒ අනුව අදානි සමාගම සිය උපරිම මෙහෙයුම් ධාරිතාවයට ප්‍රවේශ

☞ 02 පිටුවට

# උතුරේ ධීවර ගැටලුවලට චීන සැනසිලි තෑගි

ඉන්දීය ධීවර යාත්‍රා ලංකාවේ උතුරේ ධීවර බිම් වෙත නීති විරෝධී ලෙස ප්‍රවේශ වීම මෑතකාලීනව විශාල ලෙස වැඩි වේ. ඔවුන් විසින් කරනු ලබන මුහුදු සීමා උල්ලංඝනය කිරීමත් බොටම් ට්‍රෝලර් වැනි විනාශකාරී ක්‍රම හරහා මත්ස්‍ය සම්පත සූරා කෑමත් ලංකාවේ උතුරේ ධීවර ප්‍රජාවගේ දැඩි විරෝධයට ලක්ව තිබේ.

රුපියල් ලක්ෂ හතරක පමණ දැවැන්ත මත්ස්‍ය අස්වැන්නක් නෙලා ගත හැකි තහනම් බොටම් ට්‍රෝලර් දැලක් මෑතකදී යාපනය ගුරු නගර් ධීවරයන් විසින් සොයාගෙන තිබේ. පසුගිය වසරේදී අත්අඩංගුවට ගත් ඉන්දීය ට්‍රෝලර් යාත්‍රා හැට හතක් වෙන්දේසි කරනු ලබන තෙක් දිගු කාලයක් ධීවර ජැටිවල ගාල් කර තිබීම නිසා ධීවරයන්ට තම යාත්‍රා සඳහා ජැටි භාවිතයටද බාධා පැමිණේ.

එයට අමතරව දේශීය ධීවර ව්‍යාපාරිකයන් විසින් නීති විරෝධී ලෙස අවසරයකින් තොරව ඉස්සන් කොටු ඇති කිරීම , ඩයිනමයිට් වැනි පිපිරුම් ක්‍රම භාවිතා කිරීම,බොටොම් ට්‍රෝලර් යාත්‍රා හා තහනම් දැල් භාවිතා කිරීමද ඉහළ යමින් තිබේ. රටේ මුහුදු සීමාවටත් වෙරළ තීරයටත් අදාල නීතිය

☞ 02 පිටුවට

සෑම වසරකම මාර්තු 8 වැනිදාට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය, පෙරටුගාමී සමාජවාදී පක්ෂයට හෝ පක්ෂයේ කාන්තා අංශය ලෙස ‘නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය’ වෙත හුදු වතාවතක් වන්නේ නැත. සමස්ත පීඩිත ජනකායකගෙන් සුවිශේෂී පීඩාවකට මුහුණ දෙන ලාංකේය වැඩකරන කාන්තාවන් සංවිධානය කිරීමට හා සමාජමය ජයග්‍රහණ වෙනුවෙන් අරගලයේ පෙරමුණ ගන්නට ඔවුන් කැඳවන අවස්ථාවක් ලෙස මෙවරද ජාත්‍යන්තර කාන්තා දින පෙළපාළිය මාර්තු 8 සවස 2.00ට කොළඹ ලිප්ටන් වටරවුමෙන් අරඹනු ලබන අතර කාන්තා දින සම්මන්ත්‍රණය, සවස 3.00ට කොළඹ, නව නගර ශාලාවේදී ආරම්භ වේ.

